# SRI LANKA EXPORT DEVELOPMENT BOARD
## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
## இலங்கை ஏற்றுமதி அபிவிருத்தி சபை
## MINISTRY OF INDUSTRY AND ENTREPRENEURSHIP DEVELOPMENT

# BEAUTYWORLD MIDDLE EAST

ශ්‍රී ලංකා වෙළඳ මණ්ඩපය **(Sri Lanka Country Pavilion)**

6 – 8 ඔක්තෝම්බර් 2026 – ඩුබායි, එක්සත් අරාබි එමීර් රාජ්‍යය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2026 ඔක්තෝම්බර් 6 සිට 8 දක්වා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ හි පැවැත්වීමට නියමිත BEAUTYWORLD MIDDLE EAST ප්‍රදර්ශනයට ශ්‍රී ලංකා වෙළඳ මණ්ඩපයක් සංවිධානය කිරීමට කටයුතු සූදනම් කර ඇත.

BEAUTYWORLD MIDDLE EAST වෙළඳ ප්‍රදර්ශනය MEASA කලාපයේ විශාලතම රූපලාවන්‍ය වෙළඳ ප්‍රදර්ශනයක් ලෙස සැලකෙන අතර, ආයුර්වේද ඖෂධීය සහ රූපලාවන්‍ය නිෂ්පාදන නිෂ්පාදකයින් / අපනයනකරුවන් / ගැනුම්කරුවන් / බෙදාහරින්නන් සඳහා එකම ස්ථානයක හමුවීමට සහ ව්‍යාපාර සාකච්ඡා කිරීමට සහ දැනුම හා තාක්ෂණය හුවමාරු කර ගැනීමට අවස්ථාවක් සපයයි. ශ්‍රී ලංකා මණ්ඩපයක් සංවිධානය කිරීමේ අරමුණ වන්නේ ශ්‍රී ලාංකික සමාගම්වලට ශ්‍රී ලංකාවේ ආයුර්වේද, ඖෂධීය සහ රූපලාවන්‍ය නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීමට, ප්‍රවර්ධනය කිරීමට සහ කලාපයේ වෙළඳපල ප්‍රවණතා අවබෝධ කර ගැනීමට හැකියාව ලබා දීමයි.

### අයදුම් කළ හැක්කේ කා හටද?

ජාත්‍යන්තර ආහාර ප්‍රමිතීන්ට අනුකූල වන සහ ජාත්‍යන්තර වෙළඳපල සැපයුම් ධාරිතාවය සහිත, පහත සඳහන් නිෂ්පාදන කාණ්ඩ යටතේ ආයුර්වේද, ඖෂධීය සහ රූපලාවන්‍ය නිෂ්පාදන නිෂ්පාදකයින් /අපනයනකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

- **Skin Care Products** (මොයිස්චරයිසර්, ෆේස් වොෂ්, ටෝනර්, හිරු කිරණින් ආරක්ෂා වීමේ ආලේපන(Sunscreens), සීරම්, ෆේස් මාස්ක්)
- **Hair Care Products** (ෂැම්පු, කන්ඩිෂනර්, හිසතෙල් (ආයුර්වේද/ඖෂධීය), කන්ඩිෂනර්, සීරම්, කොණ්ඩය වර්ණගන්වන ද්‍රව්‍ය සහ ඩයි වර්ග)
- **Makeup Products** (ෆවුන්ඩේෂන් සහ BB ක්‍රීම්, ලිප්ස්ටික් සහ තොල් සුරකුම් බාම්, අයි ලයිනර්, මස්කාරා, කාජල්, අයි ෂැඩෝ)
- **Body Care Products** (බොඩි ලෝෂන් සහ ක්‍රීම්, ස්ක්‍රබ්, ඩියෝඩරන්ට් සහ සුවඳ විලවුන්, සබන් සහ ශරීර පිරිසිදු කිරීමේ ජෙල්, අත් සහ පාද සත්කාර ක්‍රීම්, ආයුර්වේද සම්බාහන තෙල්, ඖෂධීය හර්බල් තේ)
- **Nail Care Products** (නිය ආලේපන, නිය ආලේපන ඉවත් කිරීමේ දියර, කියුටිකල් සත්කාර නිෂ්පාදන)
- **Wellness Products** ( සුවතා නිෂ්පාදන )

### සහභාගීත්ව පිරිවැය

ඉඩකඩ වෙන්කරවා ගැනීම, කුටි ඉදිකිරීම සහ අනෙකුත් සියලුම වියදම් සහභාගී වන සමාගම් විසින් දැරිය යුතුය. ප්‍රතිපාදන මත පදනම්ව, තෝරාගත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක (SME) සමාගම් සඳහා ඉඩ පහසුකම්/ඉදිකිරීම් සඳහා වන පිරිවැයෙන් කොටසක් සඳහා මූල්‍ය ආධාර සැපයීම පිළිබඳව අපනයන සංවර්ධන මණ්ඩලය සලකා බලනු ඇත.

### අයදුම් කරන ආකාරය සහ තෝරා ගැනීම

අයදුම්පත්, අපනයන සංවර්ධන මණ්ඩලයේ www.srilankabusiness.com වෙබ් අඩවියේ "Announcements" වෙතින් බාගත කළ හැකිය. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026 ජූලි 27 වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් අධ්‍යක්ෂ – අපනයන කෘෂි අංශය, අපනයන සංවර්ධන මණ්ඩලය වෙත එවිය යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "**Beauty World Middle East 2026**" යනුවෙන් සඳහන් කළ යුතුය. වැඩසටහන සඳහා සුදුසු සහභාගිවන්නන් තෝරා ගැනීම අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පත් කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ.

වැඩි විස්තර සඳහා මදුරිකා මැණික්පුර මහත්මිය – සහකාර අධ්‍යක්ෂ, **011-2300732, 070 208 7273**, **madurika@edb.gov.lk** මගින් සම්බන්ධ කරගත හැක.

**සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී**
**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**NDB / EDB කුලුන, 42, නවම් මාවත, කොළඹ 02.**
**වෙබ් අඩවිය : www.srilankabusiness.com**